# රක්ෂණ ඔප්පු තොරතුරු ලේඛනය
# මෝටර් රථ පූර්ණ රක්ෂණය

## සපයන මූලික ආවරණය:

අ. ස්වයං සිද්ධි හානිය

- ආවරණය: රක්ෂණ ආයතනය විසින් රක්ෂණය කර ඇති වාහනයට සහ එහි උපාංගවලට මේ නිසා සිදුවන පාඩුව හෝ හානිය ආවරණය කරනු ඇත.
    - අහඹුමය බාහිර හේතුවකින්
    - ගිනි,.බාහිර පිපිරීම්. ස්වයං ගිණි ගැනීම්, අකුණු සැර,ගෙවල් බිඳීම හෝ සොරකම් කිරීම්
    - ද්වේෂසහගත ක්‍රියා
    - මහාමාර්ගයේ. දුම්රිය මාර්ගයේ , දේශීය ජල මාර්ගයේ. සෝපානයේ හෝ ඔසවනයේ රැගෙනයනවිට
- බැහැර කිරීම්: වෙනත් හානි එකවර සිදු නොවන්නේ නම්. ටයර් වායු බෑග්. බැටරි, විදුලි උපාංග ආදියට වෙනත් අනතුරක් නැතිව හානි වීම. ආනුෂංගික හානි, ක්ෂයවීම්. වැහැරීම් හා ගෙවියෑම්. යාන්ත්‍රික හෝ විදුලි බිඳවැටීම් සඳහා ආවරණයක් නොමැත.
- **අමතර ප්‍රතිලාභ:** ළගම ඇති අලුත්වැඩියාකරු වෙත රැගෙන යාම වෙනුවෙන් ආරක්ෂාව සහ ඉවත් කිරීම සඳහා ගෙවිය හැකි සාධාරණ වියදම් (යතුරුපැදි සඳහා රු. 500/- දක්වා සහ අනෙකුත් වාහන සඳහා රු. 1,000 දක්වා).

(වැඩි විස්තර සඳහා කරුණාකර මෝටර් රථ ඔප්පුවේ 1-4 පිටුවල 1 කොටස බලන්න).

## ආ. තෙවන පාර්ශව වගකීම

| හානිය | උපරිම සීමාව (කොන්දේසි අදාළ වේ) |
|---|---|
| පුද්ගල තුවාල හෝ මරණය | අසීමිතයි |
| දේපල හානි - වාණිජ වාහන සහ යතුරුපැදි | රු. 15,000/- |
| දේපල හානි - පුද්ගලික මෝටර් රථ* පූර්ණ රක්ෂණ තෙවන පාර්ශව රක්ෂණ සඳහා | රු. 10,000,000/-<br>රු. 100,000/- |
| දේපල හානි - මාර්ග බලපත්‍ර සතු බස් රථ | රු. 5,000,000/- |

(වැඩි විස්තර සඳහා කරුණාකර මෝටර රථ ඔප්පුවේ 4-7 පිටුවල II කොටස බලන්න).

**ඇ. වෛද්‍ය වියදම් ආවරණය:**

වැටුප් ලබන රියදුරන්/පිරිසිදු කරන්නන් හැර, රක්ෂිතයාට හෝ භාවිත කරන්නන් සඳහා හදිසි ශාරීරික තුවාල හේතුවෙන් වෛද්‍ය වියදම් වෙනුවෙන් රු. 1,500 දක්වා. (පෞද්ගලික මෝටර් රථ සඳහා පමණි).

**අමතර ආවරණ (අමතර වාරිකයක් ගෙවීමෙන් ලබා ගත හැක):**

1. ස්වාභාවික විපත් ආවරණය
2. පුද්ගලික හදිසි අනතුරු ප්‍රතිලාභ
3. කම්කරු වන්දි ආවරණය
4. ලොරි සඳහා භාණ්ඩ ආවරණය
5. විශේෂ වින්ඩ්ස්ක්‍රීන් (ප්‍රධාන වීදුරුව)/අනෙක් වීදුරු සඳහා ආවරණය
6. දීර්ඝ කරන ලද ඇදගෙන යාමේ ගාස්තු
7. දීර්ඝ කරන ලද තෙවන පාර්ශවීය දේපල හානි ආවරණය
8. නීතිමය වගකීම් ආවරණය
9. මාර්ග බලපත්‍ර බස් රථ සඳහා අසීමිත තෙවන පාර්ශවීය තුවාල/මරණ ආවරණය
10. පුහුණුවෙන රියදුරු/පැදිකරු ආවරණය
11. අතිරේක වායු බෑග් ආවරණය
12. වාහන කුලියට ගැනීම/කුලියට බඳුදීම සඳහා බැහැර කිරීම් ආවරණය
13. වැඩ වර්ජන කැරලි සිවිල් කැලඹීම්
14. ත්‍රස්තවාදී ආවරණය
15. පිනකල් ආවරණය (නිෂ්පාදන වර්ෂය වසර 8ක් ඇතුළත මිලියන 7 ට වැඩි පුද්ගලික කාර් හා ද්විත්ව කාර්ය වාහන සඳහා)
16. ඉහළ අවදානම් අධිභාරය (විශේෂ වර්ග/ටිපර් ආදිය වෙනුවෙන් වැඩ බිම් අවදානම් ආවරණය කිරීම සඳහා)
17. වෙනස් කරන ලද (නිෂ්පාදකයින්ගේ පිරිවිතර හැර නවීකරණය කරන ලද) වාහන අධිභාරය
18. තීරුබදු අධිභාරය ප්‍රතිස්ථාපන කොටස් සඳහා දේශීය රේගු බදු බැහැර කෙරේ.

**ප්‍රධාන ලක්ෂණ(ය):**

- කල් ඉකුත් වන දින මධ්‍යම රාත්‍රී 12 දක්වා ආවරණය ක්‍රියාත්මක වේ.

**වාරික ගෙවීමේ ක්‍රමය:**

- ඔප්පු උපලේඛණයේ වෙනත් ආකාරයකින් දක්වා නොමැති නම්, වාර්ෂික වාරික ගෙවීම අවශ්‍ය වේ.

**ආවරණය නොවන දේ: (විස්තර සඳහා කරුණාකර ඔප්පු ලේඛනය බලන්න)**

1. ශ්‍රී ලංකාවෙන් පිටත අනතුරු, අලාභ, හානි හෝ වගකීම් සඳහා ආවරණයක් නොමැත.
2. ඔනෑම ගිවිසුම්ගත වගකීමකින් පැන නගින ඕනෑම හිමිකම් පෑමක්
3. ස්වාභාවික විපත්, කැරලිකෝලාහල, සිවිල් කැලඹීම් සහ ත්‍රස්තවාදය ආදිය සඳහා වෙනත් ආකාරයකින් විශේෂයෙන් ආවරණය කර නොමැති නම්.
4. යුද්ධ සහ ඒ ආශ්‍රිත අනතුරු
5. මත්පැන් හෝ මත්ද්‍රව්‍ය පානය කිරීමෙන් පසු රිය පැදවීම.
6. වංචනික හිමිකම් පෑම්
7. රථවාහන ගරාජයක, අළුත් වැඩියා, සේවා ස්ථානයක හෝ සමාන ආයතනයක භාරයේ, පාලනයේ හෝ සන්තකයේ පවතින විට

(වැඩි විස්තර සඳහා කරුණාකර මෝටර් රථ ඔප්පු ලේඛනයේ 8-12 පිටුවල ඇති පොදු බැහැර කිරීම්

සහ කොන්දේසි බලන්න).

**අදාල අතිරික්තයන්:**

එක් එක් හිමිකම් පෑමක් සම්බන්ධයෙන් පහත දක්වා ඇති මුදල සඳහා වගකීම ඔබ සතුය.

| | |
|---|---|
| අ. යතුරු පැදි | ඕනෑම **ඔප්පු** කාල සීමාවක් තුළ පළමුව රු.2000/- සහ ඉන් පසුව සෑම හිමිකමක් සඳහාම රු. 4000/- |
| ආ. සියලුම කුලී වාහන | රු. 1000/- |
| ඇ. සියලුම කුලීපිට බදු දෙන වාහන | රු. 5000/- |
| ඉ. සියලුම කුලීපිට බදු දෙන මෝටර් සයිකල් | රු. 2000/- |
| ඊ. මෝටර් හෝම් | 10% හෝ රු. 10,000/- යන දෙකෙන් වැඩිම ප්‍රමාණය |

උ. වාහනවල වයස මත අනිවාර්ය අතිරික්තය

i අවුරුදු 10 ට වැඩි රු. 1000/-

ii. අවුරුදු 15 ට වැඩි රු. 1500/-

iii. අවුරුදු 20 ට වැඩි රු. 2000/-

ඌ. වාහනයේ තත්ත්වය මත අතිරික්තය/අහිතකර හිමිකම් පෑම්

එ. ස්ව කැමැත්තෙන් දරණ අතිරික්තය

**රක්ෂණය අවලංගු කිරීම:**

• රක්ෂණ ඔප්පුවේ නියමයන්ට අනුව මුදල් ආපසු ගෙවීම් ලබා දෙමින්, රක්ෂණ ඔප්පුව රක්ෂිතයා හෝ රක්ෂණ ආයතනය විසින් අවසන් කළ හැකිය.

(වැඩි විස්තර සඳහා මෝටර් රථ ඔප්පු ලේඛනයේ 11 පිටුවේ කොන්දේසි 6 බලන්න).

**හිමිකම් ක්‍රියා පටිපාටිය සහ අවශ්‍ය ලියකියවිලි:**

• වාහන හානිය: අනතුර පිළිබඳව රක්ෂණ සමාගමට සහ ළඟම ඇති පොලිස් ස්ථානයට දැනුම් දෙන්න. දුරකථන ඇමතුමකින් වුවත් දැනුම් දීම කළ හැකිය. අනතුරට අදාළ පොලිස් වාර්තාව, වාහන අලුත්වැඩියා ඇස්තමේන්තුව, අලුත්වැඩියා බිල්පත්, මුක්තාවශේෂ හෝ රක්ෂණ ආයතනය විසින් ඉල්ලා සිටින වෙනත් ඕනෑම ලියවිල්ලක්. ලබා දිය යුතුය.

• තෙවන පාර්ශවීය හිමිකම්: හිමිකම් පෑම දැනුම් දුන් පසු පහත ලියකියවිලි සහ ඔබේ සහාය අවශ්‍ය වේ. අවශ්‍යතාවය අනුව පහත සඳහන් කරුණුවලට අමතරව රියදුරුගේ පළමු පොලිස් ප්‍රකාශය සහ රියදුරු බලපත්‍රය, වාහන ලියාපදිංචි සහතිකය සහ අනුමැති ලිපිය අවශ්‍ය වනු ඇත.

- තෙවන පාර්ශවීය මරණය: සහතිකය, පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව, නීත්‍යානුකූල උරුමක්කාර ලේඛන,චෝදනා පත්‍රය සමග මහේස්ත්‍රාත් අධිකරණයේ විනිශ්චය නියෝගය සහ අවශ්‍ය වෙනත් ලියකියවිලි.
- තෙවන පාර්ශවීය ස්ථිර/තාවකාලික ආබාධිතභාවය: වෛද්‍ය සහතිකය, පොලිස් වාර්තාව සහ මහේස්ත්‍රාත් අධිකරණයේ විනිශ්චය නියෝගය සමග චෝදනා පත්‍රය (අදාළ නම්), සේවායෝජකයාගේ තහවුරු කිරීම සහ අවශ්‍ය නම් වෙනත් ලියකියවිලි.
- තෙවන පාර්ශවීය දේපල: හිමිකම් පාන්නාගෙන් ලැබෙන ඉල්ලීම් ලිපිය,චෝදනා පත්‍රය සමග මහේස්ත්‍රාත් අධිකරණ තීන්දුව, දේපළ/වාහන හානි සඳහා සවිස්තරාත්මක ඇස්තමේන්තු, දේපළ/වාහන සඳහා අයිතිය තහවුරු කරන ලියකියවිලි ආදිය.

• තෙවන පාර්ශවයක් නඩු කටයුතු ආරම්භ කර ඇත්නම්, සිවිල් අධිකරණවල තෙවන පාර්ශවීය හිමිකම් සඳහා නඩු කටයුතු ආරම්භ කිරීමේ, සිතාසිය නිකුත් කල වහාම අදාළ සිතාසියේ සහ පැමිණිල්ලේ පිටපතක් ඉදිපත් කල යුතුය.

**රක්ෂණ ඔප්පු හිමියාගේ වගකීම්:**

• ලබා ගැනීමේදි: සියලු වැදගත් කරුණු නිවැරදිව හෙළි කරන්න.

• රක්පණ ඔප්පු කාලසීමාව තුළ: කිසියම් සැලකිය යුතු වෙනස්කම් රක්පණකරුට දැනුම් දෙන්න සහ අවශ්‍ය විටෙක අමතර වාරිකය ගෙවන්න.

• හිමිකම් පෑමක් කරන විට: අවශ්‍යතා සපුරාලන්න, අවශ්‍ය සියලුම ලියකියවිලි සහ විස්තර සපයන්න. සියලු වැදගත් කරුණු නිවැරදිව හෙළි කරන්න.

**පැමිණිලි කිරීමේ ක්‍රියා පටිපාටිය:**
අපගේ අභ්‍යන්තර පැමිනිලි හැසිරවීමේ ක්‍රියා පටිපාටිය අනුගමනය කිරීම සඳහා ඔබට පහත ක්‍රම මගින් පැමිණිල්ලක් ඉදිරිපත් කළ හැකිය;
• දුරකථනයෙන් - 0112357357 හි ඇමතුම් මධ්‍යස්ථානය
• විද්‍යුත් තැපෑලෙන් - slic@srilankainsurance.com
• තැපෑලෙන් - පාරිභෝගික සේවා නිලධාරි ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ්, 21, වොක්ෂෝල් වීදිය, කොළඹ 2.
• ළගම ඇති ශාඛාවට පැමිණීමෙන්

**ගැටලු විසඳීම:**
• පැමිණිලි විසඳුම ගැන සෑහීමකට පත් නොවන්නේ නම්, ඔබට ශ්‍රී ලංකා රක්පණ ඔම්බුඩ්ස්මන්වරයා හෝ පහත සඳහන් සම්බන්ධතා අංකවලින් ශ්‍රී ලංකා රක්පණ නියාමන කොමිෂන් සභාව ඇමතිය හැක.

**රක්ෂණ ඔම්බුඩ්ස්මන්**
ලිපිනය: අංක 143A,, වජිර පාර, කොළඹ 05, ශ්‍රී ලංකාව.
දුරකථන+94 11 250 5542 / +94 11 250 5041
විද්‍යුත් තැපෑල: info@insuranceombudsman.lk

**ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව**
ලිපිනය: 11 වන මහල, නැගෙනහිර කුළුණ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 1.
දුරකථන: 011 2396184 - 9 (සාමාන්‍ය) 011 2335167 (පැමිණිලි)
විද්‍යුත් තැපෑල: info@ircsl.gov.lk

**• තීරකීකරණය/සමථකරණය භාවිතා කිරීම.**
(වැඩි විස්තර සඳහා මෝටර් රථ ඔප්පු ලේඛනයේ 12 පිටුවේ කොන්දේසි 8 බලන්න).

**• නඩු පැවරීම**
ඉහත සඳහන් ඕනෑම දෙයකින් ලැබුණු අවසාන විසඳුම ගැන ඔබ සෑහීමකට පත් නොවන්නේ නම්, රක්පණ ආයතනයේ තීරණයට එරෙහිව ඔබට නීතිමය ක්‍රියාමාර්ග ගත හැකිය.

**වැදගත් සටහන්:**

• මෙම ලේඛනය සාරාංශයක් සපයන අතර පුද්ගලීකරණය කර නොමැත. ඔප්පු නියමයන් සහ කොන්දේසි මෙම ලේඛනයට වඩා බලපැවැත්වේ.

• ඔප්පු නිකුත් කිරීමේ සහ අවශ්‍ය පරිදි යාවත්කාලීන කිරීමේදී පැවරුම්ලාභීන් නම් කරන්න.

**වැඩිදුර තොරතුරු සඳහා:**

• අදාල ශාඛාව දුරකථනයෙන්- 0112357357 හෝ විද්‍යුත් තැපෑලෙන් - slic@srilankainsurance.com

අමතන්න.

**මතක තබා ගත යුතු කරුණු කිහිපයක්**

• ඕනෑම වංචනික හිමිකම් පෑමක් හෝ ක්‍රියාවක් හේතුවෙන් රක්ෂණ ඔප්පුව යටතේ ඇති සියලුම ප්‍රතිලාභ අහිමි වනු ඇත.

• ඌණ රක්ෂණ හිමිකම් අඩු කිරීමෙන් වැලකී සිටීම සඳහා වාහනය එහි වර්තමාන වෙළඳපල වටිනාකමට රක්ෂණය කිරීම ඔබේ වගකීමකි.

• රක්ෂණ ඔප්පුව යටතේ ඇති සියලුම හිමිකම් ගෙවීම් ඔප්පුවේ අදාළ නියමයන් බැහැරකිරීම් සහ කොන්දේසි වලට යටත් වේ.

**වැදගත් සටහන:**

රක්ෂණ ඔප්පු තොරතුරු ලේඛනය, ප්‍රධාන ආවරණ අතිරේක ආවරණ (අදාල නම්) හා ප්‍රධාන ලක්ෂණයන් පිළිබඳ සාරාංශයක් සැපයීමට අදහස් කරන අතර, ඔබේ නිශ්චිත පුද්ගල අවශ්‍යතා සඳහා පුද්ගලීකරණය කර නොමැත. ඔබේ ඔප්පු ලේඛනයේ සම්පූර්ණ සහ පුද්ගලීකරණය කළ තොරතුරු පිළිබඳ සම්පූර්ණ පූර්ව ගිවිසුම් සහ ගිවිසුම් නියමයන් සහ ඔප්පුවේ බැහැර කිරීම් සපයා ඇත. රක්ෂණ ඔප්පු තොරතුරු ලේඛනය, ඔප්පුවේ /ගිවිසුමේ කොටසක් නොවිය යුතුය. එබැවින්, කිසියම් ගැටුමක් ඇති වුවහොත්, ඔප්පු ලේඛනයේ සඳහන් නියමයන් සහ කොන්දේසි බලපැවැත්වෙනු ඇත.